කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2017

| 9 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය | කාලයඃ පැය 02 |
|---|---|---|

නමඃ ..............................................................................................

I පත්‍රය

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

(1) "මිනිසෙකු සිරගත කළත් සිතුවිලි සිරගත කළ නොහැක" යන පණිවිඩය ලෝකයට දෙනු ලැබුවේ.

I. ප්‍රැන්සිස් බේකන් II. මැක්සිම් ගෝර්කි
III. ඇන්ටන් චෙකොෆ් IV. නෙල්සන් මැන්ඩේලා

(2) "දෙවියන් විසින් මිහිමත මවන ලද සුන්දරතම බිම්කඩ" යන්න ශ්‍රී ලංකාව හැඳින්වූයේ

I. ආර්.එල්.බ්‍රෝහියර් II. රොබට් නොක්ස්
III. ජූඩම් රුබේරු IV. ජෝන් ඩී මාර්පෝලි

(3) ජනතාව නිර්මාණශීලීව හා ධෛර්ය සම්පන්නව කැපී පෙනීමෙන් යුතුව කටයුතු කිරීම තුළ ලොව ප්‍රමුඛ පෙළේ කාර්මික රටක් බවට පත් වූ දෙවන ලෝක යුද්ධයෙන් බිහිසුණු ලෙස විනාශයට පත්වූ රට වන්නේ

I. ජපානය II. චීනය
III. දකුණු කොරියාව IV. ඉන්දියාව

(4) අන්‍යෝන්‍ය ලැදියාව හා සහජීවනය ආරම්භ වන්නේ

I. පාසල තුළිනි II. ගම තුළිනි
III. පන්සල තුළිනි IV. පවුල තුළිනි

(5) ලෝක සාමය හා සහජීවනය ගොඩනැගීමත්, අන්තර්ජාතික ගැටුම් අවම කිරීමත් අරමුණු කොටගෙන පිහිටුවා ඇති සංවිධානය වන්නේ

I. එක්සත් ජාතීන්ගේ සංවිධානය II. නොබැඳි සංවිධානය
III. සාර්ක් සංවිධානය IV. යුරෝපා සංගමය

(6) "හොඳම පොත් මුලින් ම කියවන්න. නැතහොත් ඔබට ඒවා කියවීමට කොහෙත්ම අවස්ථාවක් නොලැබෙනු ඇත" යන්න ප්‍රකාශ කළේ

I. තෝරෝ විසිනි II. ඊ.එම්.පෝස්ටර් විසිනි
III. කුමාරතුංග මුණිදාස විසිනි IV. ෆ්‍රැන්සිස් බේකන් විසින්

(7) ලෝකයේ බිහිවූ ශ්‍රේෂ්ඨ කලා නිර්මාණ, විද්‍යාත්මක නිමැවුම් ආදිය බිහිවූයේ නිර්මාණකරුවන් හමුවේ මතුවූ,

I. අභියෝග නිසා ය II. ආත්ම ශක්තියෙන් හීන වීම නිසා ය
III. ලාභ ප්‍රයෝජන නිසා ය IV. කීර්ති ප්‍රශංසා නිසා ය

(8) තීරණ ගැනීමේදී වඩා වැදගත් වන්නේ

I. අනුන් ගැන සිතා තීරණ ගැනීම යි
II. නිවැරදි වේලාවට නිවැරදි තීරණ ගැනීම යි
III. අන් අයට තමන් වෙනුවෙන් තීරණ ගැනීමට ඉඩදීම යි
IV. කාලයට තීරණ ගැනීමට ඉඩ ලබාදීම යි

(9) රටකට ජාතියකට බරපතල ආර්ථික සාමාජීය හා දේශපාලන බලපෑම් ඇතිකළ හැකි ලෙස හානි ඇතිවන සිද්ධීන්

I. අනතුරු ය II. විපත් ය

III. ආපදා ය IV. ව්‍යසනයන් ය

(10) භූගෝලීය වශයෙන් දුරස්ථ බව ඉක්මවා සාමාජීය වශයෙන් ලෝකයට සමීපව කටයුතු කිරීම

I. කාර්මීකරණයයි II. ගෝලීයකරණයයි

III. වාණිජකරණයයි IV. සාමාජීයකරණයයි

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට 'අ' සහ 'ඉ' තීරු එකිනෙක ගලපා නිවැරදි පිළිතුර යටින් ඉරක් අදින්න.**

| "අ" | "ඉ" |
|---|---|
| (11) i. විදුලි බල්බය නිපදවා ලොව ගෞරවාදරයට පත් විද්‍යාඥයා | A. සී.ඩබ්.ඩබ්.කන්නන්ගර මහතා |
| ii. කළු ජාතිකයන්ගේ නිදහස උදෙසා විප්ලවීය සටනක් ගෙනගිය ජන නායකයා | B. තෝමස් අල්වා එඩිසන් මහතා |
| iii. ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපන පනත මගින් නිදහස් අධ්‍යාපනය ලබා දුන් අධ්‍යාපනඥයා | C. ඒබ්‍රහම් ලින්කන් මහතා |
| iv. චීනය නව මගකට යොමුකළ නායකයා | D. මාඕ සේතුං මහතා |

I. BCAD II. BACD III. ABCD IV. CBDA

| "අ" | "ඉ" |
|---|---|
| (12) i. බහුවිධ බුද්ධි න්‍යාය හඳුන්වා දුන්නේ | A. ජෙෆ්රි බාවා |
| ii. භෞතික විද්‍යා මහාචාර්ය වරයෙකු මෙන්ම දක්ෂ වයලීන වාදකයෙකි | B. ලුවී බ්‍රේල් |
| iii. ලෝක පූජිත "අගා ඛාන්" සම්මානයෙන් පිදුම්ලද ශ්‍රී ලාංකිකයෙකි. | C. ඇල්බට් අයින්ස්ටයින් |
| iv. අන්ධ පුද්ගලයන්ට ලිවීමට කියවීමට හැකිවන පරිදි සම්පූර්ණ හෝඩියක් බිහිකිරීමට මග පෑදුවේ | D. මහාචාර්ය හොවාඩ් ගාඩ්නර් |

I. DCBA II. CDAB III. DCAB IV. ACBD

| "අ" | "ඉ" |
|---|---|
| (13) i. නගර නිර්මාණය, ගෘහ නිර්මාණ ශිල්පය | A. නයිල් නිම්න ශිෂ්ටාචාරය |
| ii. විසිතුරු මැටි බඳුන් | B. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය |
| iii. පිරමිඩ ඉදිකිරීමේ තාක්ෂණය | C. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය |
| iv. භූමිය සිතියම්ගත කිරීම, ගණිත ක්‍රම, දින දර්ශනය | D. හොවැංහෝ ශිෂ්ටාචාරය |

I. DBCA II. CABD III. BDCA IV. BDAC

| "අ" | "ඉ" |
|---|---|
| (14) i. මූලික අයිතිවාසිකම් කඩවුවහොත් ගතහැකි ක්‍රියාමාර්ග දක්වා තිබීම | A. අධිකරණය |
| ii. යුක්තිය පසිඳලීම | B. පොලීසිය |
| iii. අපරාධකරුවන් නීතිය ඉදිරියට පැමිණවීම | C. ආරක්ෂක හමුදාව |
| iv. ජාතික ආරක්ෂාව තහවුරු කොට පවත්වාගෙන යාම | D. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව |

I. ACBD II. DACB III. DABC IV. DBCA

"අ" | "ආ"

(15) i. මූලික අවශ්‍යතා සැපයීම — A. ආගමික ආයතන

ii. දැනුම කුසලතා ආකල්පවලින් යුතු යහපත් පුරවැසියන් බිහිකිරීම — B. පවුල

iii. අධ්‍යාත්මික සංවර්ධනයක් ඇතිකිරීම — C. සාමජ සංවිධාන

iv. ගැටුම් අවම කිරීම — D. පාසල

I. BDAC II. BDCA III. DBAC IV. ADBC

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.**

(16) ධාතුසේන රජතුමා විසින් කරවන ලද යෝධ ඇල හෙවත් ජය ගඟ කිලෝමීටර 36 ක් පමණ දිග වන අතර ඇල මාර්ගයේ බෑස්ම කිලෝමීටරයට මිලිමීටර ..................... පමණ වන සේ බැවුම් කර ඇත.

( 100 , 95 , 90 )

(17) ජනතාව විසින් ජනතාව උදෙසා කරනු ලබන පාලන ක්‍රමය ........................................................ ලෙස හඳුන්වයි.

( ලිබරල්වාදය , ඒකාධිපතිවාදය , ප්‍රජාතන්ත්‍රවාදය )

(18) වාර්ගික, ආගමික, භාෂා, කලා, ප්‍රාදේශීය, වර්ණ, ඇදහිලි, විශ්වාස වශයෙන් විවිධත්වයක් සහිත සංස්කෘතීන් ඇතුළත් සමාජය ............................................................ සමාජයක් ලෙස හඳුන්වයි.

( බහු ආගමික , බහු සංස්කෘතික , බහු වාර්ගික )

(19) වර්තමාන ශ්‍රී ලංකාවේ ඡන්ද බලය වයස අවුරුදු .............................. ට වැඩි සෑම පුරවැසියෙකුට ම හිමි වේ.

( 18 , 21 , 16 )

(20) අනතුරක් සිදු වූ අවස්ථාවක සිට රෝහලට ගෙන යන තුරු දිය යුතු ................................ පිළිබඳ දැනුවත් ව සිටීම අත්‍යවශ්‍ය ය.

( ඖෂධ , ප්‍රථමාධාර , ආහාර )

| කැලණිය අධ්‍යාපන කලාපය |
|---|
| දෙවන වාර පරීක්ෂණය - 2017 |

| 9 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය |
|---|---|

II පත්‍රය

- **පළමු ප්‍රශ්නයට පිළිතුරු ලිවීම අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න <u>හතරකට</u> පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු ලිවිය යුතු සම්පූර්ණ ප්‍රශ්න ගණන <u>පහකි</u>.**

(1) දෙවන වාරය තුළදී ඔබ ශ්‍රේණියේ සහභාගී වූ ක්ෂේත්‍ර චාරිකාවට අදාළව පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. ඔබ ක්ෂේත්‍ර චාරිකාව සඳහා තෝරාගත් ස්ථානය නම් කරන්න. (ලකුණු 2)

II. එම ස්ථානය තෝරා ගැනීමේ දී ඔබට මුහුණ පෑමට සිදු වූ ගැටලු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

III. එම ගැටලු විසඳා ගැනීම සඳහා ගත් ක්‍රියා මාර්ග දෙකක් ලියන්න. (ලකුණු 4)

IV. ක්ෂේත්‍ර චාරිකාවට යාමට පෙර ඔබට ලබා දුන් ගුරු උපදෙස් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 4)

V. ක්ෂේත්‍ර චාරිකාවෙන් පසුව ඔබේ සිතට නැගුණු සිතුවිලි පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 4)

(2) I. මිනිසා සතුව පවතින බුද්ධිමය හැකියා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

II. ඔබ සතු හැකියා වැඩි දියුණු කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග 4 ක් සඳහන් කරන්න. (ලකුණු 4)

III. පාසල තුළ සහජීවනයෙන් යුතුව කටයුතු කරන අවස්ථා දෙකක් නම් කර ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 5)

(3) I. යහජීවනයට අවශ්‍ය ගුණාංග දෙකක් ලියන්න. (ලකුණු 2)

II. ඔබ සඳහන් කළ යහජීවන ගුණාංග අනුගමනය නොකිරීමෙන් ඇතිවන ප්‍රතිඵල හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)

III. "කාටත් හිමි පොදු දේ නම් - නැති බැරි හිඟ අවහිර කම්
මේ දේ මැඩගෙන දස්කම් - පෑම තමයි සුරු විරු කම්"

ඉතා සීඝ්‍රයෙන් දියුණු වන තරගකාරී ලොවක අතරමං නොවීමට ඉහත කවිය තුළින් ඔබට දෙන පණිවිඩය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 5)

(4) I. ඔබ එදිනෙදා ජීවිතයේදී ගනු ලබන තීරණ වර්ග දෙකක් ලියන්න. (ලකුණු 2)

II. තීරණ ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)

III. නිවැරදි තීරණ ගැනීම තුළින් ජයග්‍රහණය කරා ලංවූ පුද්ගල චරිතයක් නම් කර ඔහු පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 5)

(5) I. මානව ක්‍රියාකාරකම් නිසා සිදුවන ආපදා වර්ග දෙකක් ලියන්න. (ලකුණු 2)

II. ඖෂධ භාවිතයේදී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)

III. අනතුරු හා ආපදා සම්බන්ධව කටයුතු කරනු ලබන ආයතන දෙකක් සඳහන් කර ඉන් එක් ආයතනයක කාර්යයන් පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 5)

(6) I. සමාජ සුරක්ෂිතතාව සඳහා පවුලකින් ඉටු විය යුතු කාර්යයන් දෙකක් නම් කරන්න. (ලකුණු 2)

II. වර්තමාන ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන සමුපකාර සමිති හතරක් නම් කරන්න. (ලකුණු 4)

III. සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා පුද්ගලයින් සතු වගකීම් දෙකක් සඳහන් කර ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 5)

(7) I. නවීන තාක්ෂණික ක්‍රම භාවිතය තුළින් කෘෂිකාර්මික අංශයේ ඇතිකරන ලද වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

II. තාක්ෂණික වෙනස්වීම් ජන ජීවිතය කෙරෙහි හිතකර ලෙස බලපා ඇති අවස්ථා නම් කරන්න. (ලකුණු 4)

III. තාක්ෂණික වෙනස්කම් ජන ජීවිතය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති අවස්ථා දෙකක් සඳහන් කර ඉන් එකක් පිළිබඳ කෙටි විතරයක් කරන්න. (ලකුණු 5)